හි සඳහන් සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව ලැබෙන පරිදි ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

| පාඨමාලා අංකය 03 :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය |
|---|

4.3

4.3.1 2024 වර්ෂයට අදාළ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සමඟ වෙනත් ඕනෑම විෂයයන් දෙකක් ඇතුළු ව විෂය තුනක් (03) එකවර සමත් වීම ;

*හා*

4.3.2 3.0 හි 3.3 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

***සැලකිය යුතු යි :-***

බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්, ඔවුන් අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට ලබා ඇති ප්‍රවීණතාව හා එම විෂයයට ලබා ඇති ලකුණට ප්‍රමුඛතාව දෙමින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

- **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල**

(i) සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද අයදුම්කරුවන් අතුරින් අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට A ප්‍රවීණතාව ලබා ඇති අයදුම්කරුවන් විෂයයට ලබා ඇති ලකුණට ප්‍රමුඛතාව ලබා දෙමින් තෝරා ගනු ලැබේ.

(ii) ඉන් අනතුරුව තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට B ප්‍රවීණතාව ලබා ඇති අයදුම්කරුවන් විෂයයට ලබා ඇති ලකුණට ප්‍රමුඛතාව ලබා දෙමින් තෝරා ගනු ලැබේ.

(iii) ඉහත අංක (ii) යටතේ තෝරා ගැනීමෙන් අනතුරුව ද පවතින පුරප්පාඩු සඳහා අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට C ප්‍රවීණතාව ලබා ඇති අයදුම්කරුවන් විෂයයට ලබා ඇති ලකුණට ප්‍රමුඛතාව ලබා දෙමින් තෝරා ගනු ලැබේ.

**5.0 ශික්ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය :**

5.1 *තෝරා ගැනීමේ පදනම*

5.1.1 2024 වර්ෂයට අදාළ අ.පො.ස.(උ.පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා 2029 වර්ෂයේ ගුරුභවතුන් විශ්‍රාම යාම නිසා පාසල් පද්ධතියේ ඇති වන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව සහ මේ වන විට ද පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව ද දුෂ්කර ප්‍රදේශවල විෂයය විවිධත්වය ඇති කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද සලකා බලා විෂයය මට්ටමින් ගුරු අවශ්‍යතාව ගණනය කර, එම සංඛ්‍යාව 2026 වර්ෂයේ දී ශික්ෂණලාභීන් සඳහා විද්‍යාපීඨය තුළ එකවර පහසුකම් සපයා දිය හැකි සංඛ්‍යාව සමඟ ගලපා බඳවා ගනු ලබන ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

5.1.1.1 බඳවා ගනු ලබන සංඛ්‍යාව සඳහා බලපානු ලබන ප්‍රධානතම සාධකය වන්නේ එක් එක් පාඨමාලාව සඳහා විද්‍යාපීඨය තුළ පහසුකම් සපයා දිය හැකි ශිෂ්‍ය සංඛ්‍යාවයි.

5.1.1.2 ඒ අනුව 2024 වර්ෂයට අදාළ අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත 2026 වර්ෂයේ බඳවා ගැනීම් පහත සඳහන් පරිදි සිදු කෙරේ.

(i) බඳවා ගැනීමට නියමිත සමස්ත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් දිස්ත්‍රික් පදනමින් ද, ඉතිරි 50% ජාතික පදනමින් ද බඳවා ගනු ලැබේ. ජාතික හා දිස්ත්‍රික් පදනම් සඳහා පුරප්පාඩු වෙන් කිරීමේ දී ජාතික පදනමට ප්‍රමුඛතාව දෙනු ලැබේ.

(ii) *ගැසට්* නිවේදනයේ දක්වා ඇති පරිදි යම් පාඨමාලාවකට අදාළ දිස්ත්‍රික්කවලින් බඳවා ගනු ලබන බවට දන්වා ඇති සංඛ්‍යාව, දිස්ත්‍රික්ක පදනම යටතේ අයදුම්කරුවන් ලබා ඇති Z අගයේ අනුපිළිවෙල සමඟ *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සෙසු සුදුසුකම් ද නිසි පරිදි සම්බන්ධ කරමින්, 4.0 හි ‘සැලකිය යුතුය’ යන ඡේදයේ සහ

9.5 අයදුම් කරන අවස්ථාව වන විට යම් අයදුම්කරුවකු හට පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් (Personal E-mail Address) නොමැති නම් මාර්ගගත ක්‍රමවේදය (Online System) අනුව අයදුම් කිරීමට පෙර පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස් කර ගැනීම අනිවාර්ය වේ. මෙම විද්‍යුත් තැපැල් ලිපිනය අයදුම්කරුට පෞද්ගලික වන සේ සකස් කර තිබිය යුතු වේ.

9.6 එසේම යම් පාඨමාලාවකට *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් නොමැති ව අයදුම් කිරීමෙන් පසු, ඉන් අයදුම්කරුට සිදුවන අපහසුතාවන් පිළිබඳ ව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

9.7 සෑම අයදුම්කරුවකු ම මාර්ගගත ක්‍රමවේදය (Online System) හරහා අයදුම් කළ පසු එම අයදුම්පතෙ හි පිටපතක් මුද්‍රණය කර ලබා ගැනීමේ හැකියාව අයදුම්කරු වෙත සලසා දී ඇති අතර, එසේ ලබා ගන්නා ස්ථිර දෘඪ පිටපත (Hard Copy - PDF) තමන් භාරයේ රඳවා ගත යුතුය. යම් විමසීමක් හෝ අභියාචනයක් හෝ ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දී ම අදාළ ලේඛනයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ අනවධානයෙන් කටයුතු කිරීම හේතුවෙන් අයදුම්කරු පත්වන අපහසුතාව පිළිබඳ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය කිසිදු වගකීමක් දරනු නොලැබේ.

9.8 එමෙන්ම අයදුම්කරු විසින් අයදුම් කිරීම සිදු කළ පමණින් ඇතුළත් වීමට සුදුසුකම් නොලබයි. තවද ඒ ඒ දිස්ත්‍රික්ක හෝ ජාතික පදනමින් ඇති පුරප්පාඩු සහ *ගැසට්* නිවේදනයේ සඳහන් කොන්දේසි ප්‍රකාර ව පමණක් බඳවා ගැනීම සිදු කෙරේ. මේ සම්බන්ධයෙන් අවසාන තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ලේකම් සතු වේ.

9.9 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන්/ සේවයෙන් පහ කරනු ලබන අතර, ඉන් ඉදිරියට රාජ්‍ය සේවයේ කිසිදු පත්වීමක් සඳහා නුසුදුස්සකු වනු ඇත.

10.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් හා කොන්දේසි මත මතු වන ගැටලු හෝ විශේෂ අවස්ථා පිළිබඳ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ/ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

11.0 මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල භාෂා පාඨය සමඟ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨවල යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් වේ.

ඇමුණුම 1

**12.0. 2024 වසරට අදාළ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ශික්ෂණලාභීන් බඳවා ගැනීම 2026**

| | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂය නාමය | ජාතික පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | දිස්ත්‍රික් 'එකතුව | එකතුව |
| ඉංජිනේරු තාක්ෂණ-වේදය | 35 | 2 | 2 | 1 | 2 | 1 | 1 | 1 | 2 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 35 | 70 |
| ජෛව පද්ධති තාක්ෂණ-වේදය | 35 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 2 | 1 | 1 | 2 | 1 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 35 | 70 |

